ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනා (IFB)

## ශ්‍රී ලංකා - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන පහක් (5) ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය

## IFB අංකය: PS/03/PB/PR/05/28/23

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **ශ්‍රී ලංකා - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන පහක් (5) ක්** සපයා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විශේෂයෙන් සඳහන් කර ඇති **ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය (ද්විත්ව කවර ක්‍රමය)** යටතේ පවත්වනු ලබන අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ අර්ථ දක්වා ඇති පරිදි සියළු යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන් වෙත විවෘතව පවතී.

   කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සුදුසුකම් ලැබීම සඳහා සාර්ථක සැපයුම්කරු අසාධු ලේඛනගත වී නොසිටිය යුතුය. යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන් සඳහා සුදුසුකම් ලැබීමේ ක්‍රියාපරිපාටියට පහත සඳහන් කරුණු ඇතුලත්වේ. (අමතර සුදුසුකම් අවශ්‍යතා ලංසු ලේඛනවල සඳහන් කර ඇත.)

   **a) සාමාන්‍ය පළපුරුද්ද :**
   ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයට පෙරාතුව අවම වශයෙන් පසුගිය වසර දහය (10) තුළ කොන්ත්‍රාත්කරුවකු, උපකොන්ත්‍රාත්කරුවකු හෝ කළමනාකරණ කොන්ත්‍රාත්කරුවකුගේ භූමිකාවේ විදේශ ගමන් බලපත්‍ර සැකසීමේ පළපුරුද්දක් සැපයුම්කරුට තිබිය යුතුය.

   **b) සමාන ආකාරයේ කොන්ත්‍රාත්තුවක විශේෂිත පළපුරුද්ද :**
   ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයට පෙරාතුව පසුගිය වසර දහය (10) තුළ අවම වශයෙන් මිලියන තුන (3) ක ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර සැකසීමේ ව්‍යාපෘතියක්වත් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

   **c) ගුණාත්මක හා ආරක්ෂණ අවශ්‍යතා :**
   ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර නිපදවන්නාවූ කර්මාන්ත ශාලාව ISO 14298 -ඉන්ටර්ග්‍රාෆ්- රාජ්‍ය මට්ටම හෝ ඊට ඉහළ මට්ටමකින් සහතික කළ යුතු අතර ISO 9001-2015 මඟින් ද සහතික කළ යුතුය.

   **d) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම :**
   පසුගිය වසර 3 තුළදී සිදු කරමින් පවතින හෝ සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්තු සඳහා සැපයුම්කරුට ලැබුණු සහතික කරන ලද මුළු ගෙවීම් ලෙස ගණනය කරන ලද **ඇමෙරිකානු ඩොලර් බිලියන 17 ක** අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් සැපයුම්කරුට තිබිය යුතුය.

   **e) මූල්‍ය ප්‍රභවයන්**
   මෙම ව්‍යාපෘතිය සඳහා සැපයුම්කරුගේ වෙනත් ශුද්ධ බැඳීම් හා **ඇමෙරිකානු ඩොලර් මිලියන** 1 කට නොඅඩු මුදල් ප්‍රවාහ අවශ්‍යතාවක් සපුරාලීමට අවශ්‍ය, කොන්ත්‍රාත්තු ගත අත්තිකාරම් මුදල් ගෙවීම් හැර ද්‍රවශීල වත්කම්, ණය බරින් තොර මූර්ත වත්කම්, ණය සීමාව, සහ වෙනත් මූල්‍ය වත්කම් වැනි මූල්‍ය ප්‍රභවයන් පැවතීම හෝ ඒවාට ප්‍රවේශවීම සැපයුම්කරු විසින් පෙන්විය යුතුය.

3. සතියේ වැඩ කරන දිනවල ගණකාධිකාරී (ප්‍රසම්පාදන), මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 14 වෙනි මහල,"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව වෙතින් හෝ දුරකතන අංක +94112887328 සහ acc_proc@pubsec.gov.lk දරන ඊමේල් ලිපිනය ඔස්සේ මේ පිළිබඳව උනන්දුවක් දක්වන, යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර ලබා ගත හැකි අතර 2023 නොවැම්බර් 9 සිට ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාල පරිච්ඡේදය තුළ දී ඉහත සඳහන් ලිපිනයේදී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක. ලංසු ලිපිලේඛන පරිශීලනය සඳහා පමණක් මහජන ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.pubsec.gov.lk) සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.immigration.gov.lk) පළ කර ඇත.

4. ශ්‍රී ලංකා **රුපියල් රු.500,000.00 ක හෝ සමාන මුදලක් ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදලට** පහසුවෙන් මාරු කළ හැකි මුදල් වර්ගයකින් ආපසු නොගෙවන ගාස්තුවක් ලෙස ගෙවීමෙන් හා ව්‍යාපාරික ලිපි ශීර්ෂයකින් ලිඛිත ඉල්ලීමක් (පහත 6 වෙනි ඡේදයේ සඳහන් ලිපිනයේ පිහිටි) මහජන ආරක්ෂක අමාත්‍යාංශ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්හට මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

5. පහත (6) ඡේදයේ සඳහන් ව ඇති ලිපිනයට **2023 දෙසැම්බර් මස 21 වැනි දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ලංසු ඉදිරිපත් කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම, **2023 දෙසැම්බර් මස 21 වෙනි දින ප.ව. 2.00 ට** මෙම අවස්ථාවට සහභාගි වීමට කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. සියළු ලංසු සමඟ ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ සමාන මුදලක් ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදලට පහසුවෙන් මාරු කළ හැකි මුදල් වර්ගයකින් **රුපියල් මිලියන දෙසීයක (රු. මිලියන 200) කට නොඅඩු මුදලක්** බැංකු සුරක්ෂණයක ආකාරයෙන් ඇප තැන්පතුවක් තැබිය යුතුය.

6. පූර්ව ලංසු රැස්වීම **2023 නොවැම්බර් මස 23 දින පෙ.ව. 11.00 ට** ශ්‍රවනාගාරය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 14 වෙනි මහල,"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව යන ස්ථානයේදී පැවැත්වේ. මේ සඳහා කැමැත්ත දක්වන සියළු ලංසුකරුවන්ට පූර්ව ලංසු රැස්වීම සඳහා සහභාගී විය හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC),**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**14 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**
**2023 නොවැම්බර් 09**

SELACINE